# මැතිවරණ කොමිෂන් සභාව
## தேர்தல் ஆணைக்குழு

පොදු කාර්යාලය : 011-2868441, 2868442, 2868443
பொது அலுவலகம்
ෆැක්ස්/தொலைநகல் : 011-2868426

මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය
සරණ මාවත,රාජගිරිය (10107)
தேர்தல் ஆணைக்குழு அலுவலகம்
சரண மாவத்தை, இராஜகிரிய (10107)

*web : www.elections.gov.lk* *e-mail : info@elections.gov.lk*


මගේ අංකය : PE1/25/2021
எனது இல.

ඔබේ අංකය :
உமது இல.

දිනය : 2021.10.25
திகதி

(இந்த கடிதத்தின் தமிழ் மொழிபெயர்ப்புக்காக தயவுசெய்து அடுத்த பக்கத்தைப் பார்க்கவும்)

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්,
සියළුම පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
සියළුම කොමිෂන් සභා ප්‍රධානීන්,
සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්,
සියළුම පළාත් ආණ්ඩුකාරවර ලේකම්වරුන්/ පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරුන්,
සියළුම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරුන්,
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
සියළුම රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සභාපතිවරුන්/ සාමාන්‍යාධිකාරීවරුන්,

**<u>ඡන්දහිමි නාම ලේඛන තොරතුරු තහවුරු කිරීමේ ප්‍රකාශය නිකුත් කිරීම.</u>**

ඡන්දහිමියන් වෙත තම ඡන්දහිමි නාමලේඛන ලියාපදිංචි තොරතුරු වඩාත් පහසුවෙන් ලබා ගැනීම සඳහා විශේෂ ඊ සේවාවක් මැතිවරණ කොමිෂන් සභාව විසින් හඳුන්වා දී ඇත. මෙම සේවාව අනුව ඕනෑම පුද්ගලයකු හට අන්තර්ජාල පහසුකම් ඇති පරිගණක/ ජංගම දුරකථන මගින් www.elections.gov.lk යන වෙබ් අඩවිය ඔස්සේ තම ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් කිරීම මගින් ඡන්දහිමි නාමලේඛන තොරතුරු තහවුරු කිරීමේ ප්‍රකාශයන් ලබාගත හැකිය. (ඔබගේ පහසුව සඳහා අදාළ ප්‍රකාශයේ ආදර්ශයක් මේ සමග යාකර ඇත.)

02. 2015 සිට 2020 දක්වා ඡන්දහිමි නාමලේඛන තොරතුරු මෙම සේවාව මගින් ලබාගත හැක. ඔබ ආයතනය විසින් මහජනතාව වෙත විවිධ සේවා ලබා දීමේදී මෙම ඡන්දහිමි නාමලේඛන තොරතුරු ප්‍රකාශය භාවිතා කරන්නේ නම් හා එහි නිරවද්‍යතාවය තහවුරු කරගැනීමට අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා විශේෂ ඊ - සේවාවක් නොමිලයේ ඔබ ආයතනය වෙත ලබාදීමට මැතිවරණ කොමිෂන් සභාව විසින් තීරණය කර ඇත. ඒ සඳහා මේ සමග ඉදිරිපත්කර ඇති අයදුම්පත සම්පූර්ණ කර නොපමාව මැතිවරණ කොමිෂන් සභාව වෙත එවීමට ක්‍රියා කරන ලෙස කාරුණිකව ඉල්ලමි.

**සමන් ශ්‍රී රත්නායක**
**මැතිවරණ කොමසාරිස් ජනරාල්**

පිටපත්: 1. ලේකම්, මැතිවරණ කොමිෂන් සභාව, - කාරුණික දැනගැනීම සඳහා.
2. අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ), - අදාළ ඊ සේවාව ලබාදීම සඳහා කාරුණිකව.


සභාපති
தவிசாளர்
දුරකථන/தொலைபேசி : 011-2868444
ෆැක්ස්/ தொலைநகல் : 011-2868445
*e-mail : comelesl@sltnet.lk*

ලේකම්
செயலாளர்
දුරකථන/தொலைபேசி : 011-2868406
ෆැක්ස්/தொலைநகல் : 011-2868406
*e-mail : admin@elections.gov.lk*

මැතිවරණ කොමසාරිස් ජනරාල්
தேர்தல்கள் ஆணையாளர் நாயகம்
දුරකථන/தொலைபேசி:011-2885207
ෆැක්ස්/தொலைநகல் :011-2885208
*e-mail: cgelection@elections.gov.lk*

DOCUMENT ID: 202110252

EC/SOER

මැතිවරණ කොමිෂන් සභාව

தேர்தல் ஆணைக்குழு

# ELECTION COMMISSION

ඡන්දහිමි ලියාපදිංචි ප්‍රකාශය வாக்காளர் பதிவுகளின் வெளிப்பாடு STATEMENT OF ELECTORAL REGISTRATION

ඡන්ද හිමියාගේ නම / வாக்காளரின் பெயர் / Name of the Elector

[redacted]

ලිපිනය / முகவரி / Address

[redacted]

ජා. හැ. අංකය / தே.அ.அ இல / NIC No

[redacted]

ස්ත්‍රී/පුරුෂ භාවය / பாலினம் / Gender

ස්ත්‍රී பெண்

වර්ෂය / ஆண்டு / Year

2015

මැතිවරණ කොට්ඨාසය / தேர்தல் மாவட்டம் / Election District

[redacted] [redacted]

ඡන්ද ප්‍රදේශය / வாக்கெடுப்புப் பிரிவு / Polling Division

[redacted] [redacted]

ඡන්ද කොට්ඨාසයේ අංකය / வாக்கெடுப்பு மாவட்ட இலக்கம் / Polling District No

[redacted]

අනුක්‍රමික අංකය / தொடர் இலக்கம் / Serial No

[redacted]

මැතිවරණ කොමසාරිස් ජනරාල්

தேர்தல் ஆணையாளர் நாயகம்

Commissioner General of Elections

2021/10/25

Verification Portal
https://eservices.elections.gov.lk

**<u>ඡන්දහිමි නාමලේඛන ප්‍රකාශයේ තොරතුරු සත්‍යාපනය කර ගැනීමට සඳහා ඊසේවා ගිණුමක් සකස් කර ගැනීම.</u>**

01) මැතිවරණ කොමිෂන් සභාව විසින් මහජනතාවගේ කටයුතු පහසුකිරීම සඳහා ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි තොරතුරු ඇතුලත් ඡන්දහිමි ලියාපදිංචි ප්‍රකාශයක් අන්තර්ජාල පහසුකම් සහිත පරිගණකයක් හෝ සුහුරු ජංගම දුරකතනයක් භාවිතයෙන් මාර්ගගත ක්‍රමයට ලබා ගැනීමට ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි සියළුම පුරවැසියන් හට පහසුකම් සලසා ඇත.

02) මැතිවරණ කොමිෂන් සභාවේ ඊසේවා වෙබ් අඩවිය වන https://eservices.elections.gov.lk/ වෙබ් අඩවියෙහි "පුරවැසියන් සඳහා" වන යොමුවෙන් පිවිස "ඡන්දහිමි ලියාපදිංචි ප්‍රකාශය" යන සේවාව මගින් එය ලබාගත හැකි අතර අවශ්‍ය සියළු උපදෙස් "භාවිතය සඳහා උපදෙස්" යටතේ දක්වා තිබේ.

03) මෙසේ මහජනතාව විසින් ලබා ගන්නා තම ලියාපදිංචි තොරතුරු ඇතුලත් ඡන්දහිමි ලියාපදිංචි ප්‍රකාශය කිසියම් ආයතනය වෙත ඉදිරිපත් කල පසු එය සත්‍ය ලේඛනයක් බවට තහවුරු කර ගැනීමට යම් ආයතනයට අවශ්‍යවේ නම් ඒ සඳහාද මැතිවරණ කොමිෂන් සභාවේ ඊසේවා වෙබ් අඩවිය මගින් පහසුකම් සලසා දී තිබේ.

04) මේ වන විටත් ඔබ ආයතනය විසින් එම පහසුකම ලබා ගැනීමට අයදුම්කොට තිබේ නම් පහත දැක්වෙන උපදෙස් පරිදි එම ඡන්දහිමි ලියාපදිංචි ප්‍රකාශ සත්‍යාපනය කරන නිලධාරියාගේ පුද්ගලික තොරතුරු ඇතුලත් කොට ( නම, හැඳුනුම්පත් අංකය, පුද්ගලික ජංගම දුරකතන අංකය සහ පුද්ගලික විද්‍යුත් තැපැල් ලිපිනය) ඊසේවා වෙබ් අඩවියට පිවිසීම සඳහා වන මැතිවරණ ගිණුම සකස් කර ගන්න.

05) ගිණුම සකස් කර ගැනීම සඳහා https://eservices.elections.gov.lk/ වෙබ් අඩවියට පිවිස එහි **Sign Up** තුලට යොමුවන්න.




05) එහි අදාල තොරතුරු සම්පූර්ණ කර ගිණුම සකස් කරන්න. ගිණුම සකස් කර ගැනීම පිළිබඳ සියළු උපදෙස් "<u>Instructions</u>" යටතේ දක්වා තිබේ.




06) ගිණුම සකස් කරගත් පසු ගිණුමේ පරිශීලක නාමය හා ජංගම දුරකතන අංකය මෙම විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමුකරන්න.

07) මෙම කටයුතු වලට තෝරාගත් නිලධාරියා විසින් මැතිවරණ කොමිෂන් සභාව සමග සිදු කරන තමාගේ පුද්ගලික කටයුතුද මෙම ගිණුම හරහා සිදුකලයුතු බැවින් මෙම ගිණුම එම නිලධාරියාගේ පුද්ගලික මැතිවරණ ගිණුම වේ. එබැවින් එම ගිණුමට එම නිලධාරියා හැර ආයතන ප්‍රධානියාද ඇතුළුව වෙනත් අයෙකුට පිවිසීම තහනම් වේ.

07) එම නිලධාරියා කවදුරටත් අදාල රාජකාරී ඉටුනොකරන්නේ නම් ඒ බව කඩිනමින් මැතිවරණ කොමිෂන් සභාව වෙත දැනුම් දීම අනිවාර්ය වන අතර ඉහත පරිදිම කටයුතු කිරීමෙන් නව නිලධාරියකුට එම අවසර ලබා දීමටද හැකියාව ලැබේ.

08) අවශ්‍ය අවසර ලබා දුන් පසු තම පරිශීලක නාමය හා මුරපදය භාවිතා කොට ඊසේවා වෙබ් අඩවියේ රාජ්‍ය ආයතන සඳහා වන යොමුවෙන් පිවිස එහි "ඡන්දහිමි ලියාපදිංචි ප්‍රකාශය සත්‍යාපනය" මගින් මෙම රාජකාරිය (සත්‍යාපන කටයුතු) සිදුකල හැකි අවශ්‍ය සියළු උපදෙස් "භාවිතය සඳහා උපදෙස්" යටතේ දක්වා තිබේ.

01) ඡන්ද හිමි නාමලේඛන ප්‍රකාශයේ තොරතුරු සත්‍යාපනය කර ගැනීමට සඳහා ඊ සේවා ලබා ගැනීමට ඔබ විසින් ඉදිරිපත් කරන ලද අයදුම් පත හැ බැඳේ.

02) ඒ සඳහා මේ සමග අමුණා ඇති ඇමුණුමෙහි දැක්වෙන උපදෙස් පරිදි https://eservices.elections.gov.lk/ වෙබ් අඩවියට පිවිස එම කාර්ය ඉටුකිරීමට නියමිත නිලධාරියාගේ පුද්ගලික තොරතුරු ඇතුලත් කර පරිශීලක ගිණුමක් සකස් කරගන්නා ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

03) ගිණුම සකස් කරගැනීමෙන් පසු ආයතනයේ නම සමග එම ගිණුමේ පරිශීලක නාමය (ඉලක්කම් 12 යුක්ත වේ) සහ නිලධාරියාගේ ජංගම දුරකතන අංකය it@elections.gov.lk විද්‍යුත් තැපැල් ලිපිනය වෙත එවන ලෙසද කාරුණිකව ඉල්ලා සිටිමි. එහිදී විෂය තීරුවේ "ඡන්ද හිමි නාමලේඛන ප්‍රකාශ සත්‍යාපනය - පරිශීලක ගිණුම් තොරතුරු" යනුවෙන් සටහන් කොට එවන ලෙසත් කාරුණිකව දන්වමි. පිළිතුරු විද්‍යුත් තැපැල් ලිපියේ ආකෘතියක්ද පහත දක්වා ඇත.

උදා -
විෂය - ඡන්ද හිමි නාමලේඛන ප්‍රකාශ සත්‍යාපනය - පරිශීලක ගිණුම් තොරතුරු
ආයතනය - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ජම්බුගහහේන
පරිශීලක නාමය - **196488808887**
ජංගම දුරකතන අංකය - 0734569852